# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අති විශෙෂ

අංක 2107/50 - 2019 ජනවාරි මස 25 වැනි සිකුරාදා - 2019.01.25

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


## I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

### රජයේ නිවේදන

එල්.ඩී.බී 1/2012(III)

**1996 අංක 2 දරන ධීවර සහ ජලජ සම්පත් පනත**

ඉන්දීය සාගර ටූනා කොමිෂන් සභාව මගින් ඇති කරගත් ගිවිසුම් සම්බන්ධයෙන් කළමනාකරණ සහ සංරක්ෂණ පියවර ගැනීමේ කාර්යය සඳහා 1996 අංක 2 දරන ධීවර සහ ජලජ සම්පත් පනතේ 61 වන වගන්තියේ (1) වන උපවගන්තියේ (ත) වන ඡේදය යටතේ ධීවර සහ ජලජ සම්පත් සංවර්ධන සහ ග්‍රාමීය ආර්ථිකය පිළිබඳ අමාත්‍යවරයා විසින් සාදනු ලබන නියෝග.

ගාමිණී විජිත් විජයමුණි සොයිසා,
ධීවර හා ජලජ සම්පත් සංවර්ධන සහ ග්‍රාමීය
ආර්ථිකය පිළිබඳ අමාත්‍ය.

2018 නොවැම්බර් මස 09 වැනි දින,
කොළඹ දී ය.

නියෝග

2015 දෙසැම්බර් 14 වැනි දින අංක 1945/7 දරන අතිවිශෙෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද විදේශීය ධජය සහිත ධීවර බෝට්ටුවල ධීවර කටයුතු සිදු කරනු ලබන ශ්‍රී ලාංකීක පුරවැසියන් සඳහා වන අවම ප්‍රමිති පිළිබඳ නියෝගවල 6 වන නියෝගයට ඉක්බිතිවම පහත දැක්වෙන නියෝගය ඇතුළත් කිරීමෙන් එම නියෝග මෙයින් සංශෝධනය කරනු ලැබේ :-

" 7. ශ්‍රී ලංකාවේ අනන්‍ය ආර්ථික කලාපය තුළ, මහ මුහුදේ හෝ වෙනත් යම් රාජ්‍යයක අනන්‍ය ආර්ථික කලාපය තුළ යම් විදේශීය ධජය සහිත ධීවර බෝට්ටුවක සේවය කරනු ලබන කිසිදු ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විසින් යම් නීතිවිරෝධී, වාර්තා නොවූ හා අවිධිමත් ධීවර කටයුත්තක නොයෙදිය යුතු ය.".

02 - 383


1A - PG 4369 — 2767 (2019/01) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.
මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.